# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/30 - 2017 මැයි මස 31 වැනි බදාදා - 2017.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දි සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්ද පහළ කෝරලේ සුළු කොට්ඨාසයේ, 927 ගුරුළුපොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගුරුළුපොත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුර අංක 299 අතිරේක අංක 7 පත්‍ර අංක 7 හා 2014.10.07 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්.

**කැබලි අංක 887 - ඉඩමේ නම: මොරකැටියවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0078**

*උතුරට* : කැබලි අංක 872 සහ කැබලි අංක 95; *නැගෙනහිරට සහ දකුණට*: කැබලි අංක අංක 95; *බටහිරට*: කැබලි අංක 95 සහ කැබලි අංක 872.

ඉහත සඳහන් *ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 අගෝස්තු මස 30 වැනි දින පෙ.ව 10.00ට මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 ජූලි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී *ඉඩම/ පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුනු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. එම්. සී. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මිනිපේ කොට්ඨාසය.

2017 මැයි මස 29 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-490


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 025649 – 17 (2017/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.